Fair Work Commission

# Fair Work Commission

අප ඔස්ට්‍රේලියාවේ රැකියා ස්ථාන පිළිබඳව කටයුතු කරන ස්වාධීන විනිශ්චය සභාවයි. රැකියා ස්ථානයේ ඇතිවන ගැටලු සම්බන්ධයෙන් අපි සේවානියුක්තිකයන්ට හා සේවායෝජකයන්ට උපකාර කරන්නෙමු. මෙයට පහත දැක්වෙන අවස්ථා ඇතුළත් වේ:



අසාධාරණ ලෙස සේවයෙන් පහ කිරීම



හිරිහැර කිරීම



ලිංගික හිරිහැර සිදු කිරීම



අසාධාරණ ලෙස සැලකීම



සේවාස්ථානයේ හිමිකම් සම්බන්ධ ආරවුල්

අපි පහත දැක්වෙන දේ ද සිදුකරන්නෙමු:

- ජාතික අවම වැටුප තීරණය කිරීම
- සමහර සේවානියුක්තිකයන් සඳහා අවම වෘත්තීය කොන්දේසි නියම කිරීම
- ව්‍යවසායික ගිවිසුම් අනුමත කිරීම
- වෘත්තීය සමිති හා සේවායෝජක සංවිධාන වැනි ලියාපදිංචි සංවිධාන නියාමනය කිරීම

අපගේ කාර්යභාරය වන්නේ සේවානියුක්තිකයන්ට මෙන් ම සේවායෝජකයන්ට ද සරල, සාධාරණ හා නම්‍යශීලි සේවාස්ථාන සම්බන්ධතා පවත්වා ගැනීමට උපකාර කිරීමයි.

වැටුප්, නිවාඩු හා වෙනත් හිමිකම් ගැන දැන ගැනීමට www.fairwork.gov.au ඔස්සේ Fair Work Ombudsman වෙබ් අඩවියට පිවිසෙන්න.

Fair Work Commission

## සේවාස්ථානයේ ගැටලු විසඳා ගැනීම

සේවාස්ථානයේ ගැටලුවක් විසඳන ලෙස ඔබ අපෙන් ඉල්ලා සිටීමෙන් ඔබ නීතිමය ක්‍රියාමාර්ගයක් ආරම්භ කරයි.

ගැටලුව පිළිබඳ විස්තර කරමින් ඔබ විසින් ආකෘති පත්‍රයක් පිරවිය යුතුය. අපගේ වෙබ් අඩවියේ 'Apply or Lodge' වෙත යන්න. අදාළ අනෙක් පුද්ගලයා සමග අපි ඔබේ ආකෘති පත්‍රය හුවමාරු කර ගන්නෙමු. ඔවුන්ගේ ආකෘති පත්‍රය ද ඔබ සමග හුවමාරු කර ගැනීම සිදු වනු ඇත.

විසඳුමක් සම්බන්ධයෙන් එකඟ වීම සඳහා ඔබට උපකාර කිරීමට අපි උත්සාහ කරන්නෙමු.

මෙය සාර්ථක නොවුව හොත් ඔබ වෙනුවෙන් ප්‍රතිඵලය තීරණය කරන ලෙස ඔබට අපෙන් ඉල්ලා සිටිය හැකිය. මෙය උසාවියේ නඩු විභාගයක් හා සමාන වනු ඇත. අපගේ තීරණය නෛතිකව බැඳී ඇත.

## ඔබේ භාෂාවෙන් වන උපකාර සඳහා

ඔබට අප ඇමතීම සඳහා Translating and Interpreting Service (TIS) භාවිතා කළ හැකිය.

Interpreter

නොමිලේ සේවා ලබා ගැනීමට
**131 450**
අමතන්න.

ඇමතුම ලබා ගන්නා අයට පහත දැක්වෙන තොරතුරු ලබා දෙන්න:

- ඔබේ භාෂාව - එවිට ඔවුන්ට ඔබව භාෂණ පරිවර්තකයෙකු සමග සම්බන්ධ කළ හැකි වනු ඇත.
- අපගේ නම - Fair Work Commission (සාධාරණ වැඩ කොමිසම)
- අපගේ දුරකථන අංකය - 1300 799 675

ඔබට හමුවීමකට හෝ නඩු විභාගයකට පෙනී සිටීමට ඇත්නම්, භාෂණ පරිවර්තකයන් සංවිධානය කර දීම ද අපට සිදු කළ හැකිය.

## නොමිලේ සැපයෙන නීති උපදෙස්

සිදු කළ යුත්තේ කුමක්දැයි සම්බන්ධයෙන් තීරණය කිරීමට ඔබට උදව් අවශ්‍ය නම්, සේවානියුක්තිකයන්ට හා කුඩා ව්‍යාපාරවලට අපෙන් නොමිලේ නීති උපදෙස් ලබා ගත හැකිය.

අපගේ වෙබ් අඩවියේ රැකියාස්ථාන උපදෙස් සේවා 'Workplace Advice Service' (රැකියාස්ථාන උපදෙස් සේවා) බලන්න.

මෙම සේවාව මගින් අසාධාරණ ලෙස සේවයෙන් පහ කිරීම, අසාධාරණ ලෙස සැලකීම, හිරිහැර කිරීම හා රැකියා ස්ථානයේ දී ලිංගික හිරිහැර සිදු කිරීම් සම්බන්ධයෙන් උපකාර ලබා දෙයි.